විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 (සංශෝධන I)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත, කොළඹ 10.
2015.10.1

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**විශ්‍රාම ගනු ලබන දිනයට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීම**

උක්ත කරුණ සම්බන්ධව ම' විසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 ට අමතර වශයෙනි.

02. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් නොමැතිව රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලබන දායක දායිකාවන්ගේ විශ්‍රාම ගැන්වීමේ අයදුම්පත් දැනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු නොකරන බැවින් එම නිලධාරීන්/නිලධාරිනියන්ට විශ්‍රාම ගැන්වීම ප්‍රමාද වන හෙයින් විශ්‍රාම ප්‍රතිලාභ හිමි ගැන්වීමද ප්‍රමාදවේ.

03. රාජ්‍ය සේවයට නව පත්වීම් ලබන නිලධාරියෙකු හෝ නිලධාරිනියක එකී පත්වීම් ලද දිනයේ සිට පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීන කිරීම, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ලියාපදිංචි කිරීම සහ ඉන් පසු දායක මුදල් අයකර ලේඛන නඩත්තු කිරීම ආයතන විසින් සිදුකළ යුතු වෙයි. නමුත් එම ක්‍රියාවලීන්හි පවතින දුර්වලතා හේතුවෙන් විශ්‍රාම යන අවස්ථාවේ දී විශ්‍රාම ලාභියා අගතියට පත් වන බව දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණයයි.

04. විශ්‍රාම ගන්නා රාජ්‍ය නිලධාරීන්ට හිමි සියලුම ප්‍රතිලාභ ඒකාබද්ධ කර එක් දිනක් ඇතුළත ප්‍රදානය කිරීමට අවශ්‍ය පියවර දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇත. ඒ අනුව යම් නිලධාරියෙකුගේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා ආයතන ප්‍රධානීන් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 03/2015 චක්‍රලේඛය අනුව PD 03 අයදුම්පත ඉදිරිපත් කිරීමේදී වැන්දඹු අනත්දරු අංකය ලබාගෙන නොමැති වුවද අදාළ අයදුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ හැකිය. නමුත් එවැනි අයදුම්පත් ලාභීන් 2015.10.01 දින සිට අන්තර්ජාලය හරහා වැන්දඹු අනත්දරු අංකය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම අනිවාර්යයෙන් සිදුකළ යුතු බව දන්වා සිටිමි.

05. එසේම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු (අවුරුදු 26ට අඩු රැකියා විරහිත) හා ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියද අන්තර්ජාලය හරහා සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. ඒ සඳහා 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 8, 9, 10 සහ 11 යන වගන්ති හා 1981 අංක 44 දරන සංශෝධන පනතේ 5වන වගන්තිය ප්‍රකාරව සියලුම රජයේ සේවකයින්ගෙන් වැන්දඹු අනත්දරු දායක මුදල අය කිරීම එම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. එකී අය කිරීම් සහතික කර ආයතන ප්‍රධානියා විසින් වැ.අ.වි.16 (මු.රෙ 1729) ආකෘති පත්‍රය මගින් නිලධාරීන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලබා දීම අත්‍යවශ්‍ය වේ.

06. එබැවින් ඉහත කරුණු පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමු කර, විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම තුළින් ප්‍රතිලාභීන්ට කඩිනමින් සේවය සැලසීම සඳහා අවශ්‍ය සහයෝගය පතමි.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - අ.ක.ස.